# ප්‍රභූ දේශපාලනය අවසන් කළ යුතු ද ?

- ආර්. ඒ. ජයවීර, වරලත් ගණකාධිකාරී

2024 ජනාධිපතිවරණයේදී හා පාර්ලිමේන්තු මැතිවරණයේදී ජාතික ජන බලවේගය (මාලිමාව) ලබාගත් ඡන්ද ප්‍රමාණයෙන් පෙනී යන්නේ ඔවුන් විසින් මහජනයා ඉදිරියේ තබන ලද කරුණු පිළිගැනීමකට ලක් වූ බවයි. එම කරුණු අතර ප්‍රමුඛස්ථානය ගත්තේ වංචාව හා දූෂණය පිටු දැකීමත්, දූෂිතයින් පලවා හැරීමත්, ප්‍රභූ දේශපාලනය අවසන් කිරීමත්ය. දේශපාලන ආර්ථික විද්‍යානුකූල (political economy) හරවත් විග්‍රහයකට නොගොස් ජනතාවගේ දුකට හා අයසට මූලික හේතුව වංචාව හා දූෂණයයැ'යි මාලිමා ප්‍රචාරක යන්ත්‍රය මගින් ඒත්තු ගන්වන ලදී . එහි මෙහෙවර පාඨය ලෙසට රාව ප්‍රතිරාව නැංවූයේ වංචා-දූෂණ පිටුදකින පිරිසිදු පාලනයක් පිහිටුවීම ය. සියළු ආර්ථික බේදවාචකයන්ගේ මූලය, වංචාව හා දූෂණය ලෙසට ඒත්තු ගන්වනු ලැබූවා පමණක් නොව කිසිම අතොරක් සිදුරක් නැතිවම වංචාව හා දූෂණය සහමුලින්ම ප්‍රභූ පන්තියට සම්බන්ධ කරන ලද්දේය. එම තර්කන ක්‍රමය යොමු වූයේ විසඳුම දේශපාලන බලය නිර්ප්‍රභූකරණය කිරීමයැ'යි ප්‍රකාශ කිරීමට ය. එමගින් අදූෂිත - පාරිශුද්ධ යහපාලනය හා නිර්ප්‍රභූකරණය යනු දෙකක් නොව එකක් යන්න ගම්‍ය කරනු ලැබ ඇත. මේ වූකලී අතිශයින්ම සරලවූත්, ආර්ථික බේදවාචකයේ මූලයන් දැන දැනම හෝ නොදැන නොතකා හරිනු ලැබූවාවූත්, හුදෙක්ම අවස්ථාවාදීවූත් නිගමනයකි.

## සොක්කන් ලොක්කන් වූ වග

කාගේත් උදහසට ලක් කරනු ලැබූ ප්‍රභූවරයා යනු කවරෙක්ද? කෙනෙකුගේ සිතට එක්වරම නැගෙන්නේ පාලන බලාධිකාරයක් බුක්ති විඳින, සුඛෝපභෝගීව ජීවත්වන සමාජයේ ඉහළ තලයේ වැජඹෙන, සේවක කාරකාදීන් පිරිවර කරගත් පුද්ගලයෙක්ය. රාජාණ්ඩු කාලයේ මේ ගණයට අයත් වූයේ රදළ ප්‍රධානීන්ය. රාජාණ්ඩුවේ මේ බල ව්‍යුහය ගම් මට්ටම දක්වාම පහළට ව්‍යාප්ත වී තිබුණි. යටත්විජිත කාල පරිච්ඡේදයේදී හා ඊට පසුව වාණිජවාදී හා ධනේශ්වර අත්තිවාරම මත නව ප්‍රභූ පන්තියක් බිහි විය. පැරණි ප්‍රභූ පන්තියේ දිගුවක්ද ඒ තුළ දක්නට ලැබිණි. ඔවුහු දේශපාලන, වෙළඳ ව්‍යාපාර, උගත් වෘත්තීන් හා රාජ්‍ය සේවය යන ක්ෂේත්‍රවල කැපී පෙනෙන පිරිස් වූහ. කුමාරි ජයවර්ධනගේ "සොක්කන් ලොක්කන් වූ වගයි (Nobodies to Somebodies)" කෘතියේ මේ ඉතිහාස කථාව දක්වා ඇත. යටත් විජිත යුගයේ අරක්කු රේන්දය වෙනුවට පසු කාලයේදී වංචාව හා දූෂණය ආදේශ වී ඇති බවක් පෙනී යයි. ප්‍රභූන් කවරේද කියා හඳුනා ගන්නා නිර්ණායක පිළිබඳව කුමන අවිනිශ්චිතතාවක් පැවතුනද ප්‍රභූන් යැයි උදහසට ලක්වූ සියලු දෙනා වංචනිකයින් හා දූෂකයින් නොවන බවත්, සියලුම වංචනිකයින් හා දූෂකයින් ප්‍රභූන්ද නොවන බවත් පැහැදිලිය. පොදුවේ චෝදනා කිරීමෙන් පෙනී යන්නේ අවස්ථානුගත වීම, ද්වේශය සහ හීන මානයයි. මෙහිදී කෙනෙකුගේ මතකයට නැගෙන්නේ "එක මකුණයි ළමයෝ කන්නේ-ඇයි ඔක්කොම මකුණො මරන්නේ" යන පැරණි ගීත පාඨයයි. අපගේ සැලකිල්ල යොමුවිය යුතු ප්‍රධානම කාරණයක් වන්නේ

ප්‍රභූත්වය පිළිබඳ සමාජය තුළ තිබෙන්නා වූ දැක්ම, එනම් ප්‍රභූවරයෙකු හඳුනා ගන්නා නිර්ණායක යළි විමසුමට ලක් කිරීමයි.

වංචාව හා දූෂණය ප්‍රභූන්ගේ නිෂ්පාදනයක්ය යන ප්‍රබල අවධාරණය නිසා දේශපාලන බලය ප්‍රභූන්ගෙන් ගලවා ගැනීම හෙවත් "නිර්ප්‍රභූකරණය" යන්න ජාතික අවශ්‍යතාවක් ලෙසට මතුකර තිබිණි. සත්‍ය කරුණු වලින් බැසගත් මේ වැරදි නිගමනය, අදූෂිත-පිවිතුරු පාලනයක් ගොඩ නැගීමේ මූලාරම්භයම අඳුරු කිරීමට හේතු වී තිබේ. වංචාව හා දූෂණය, සමාජ-ආර්ථික ව්‍යාධියේ මතුපිට රෝග ලක්ෂණයකි. රෝග ලක්ෂණයට පහර දීමට බලමුළු රැස් කරනු ලැබිණි. පැවති දේශපාලන බලය පෙරළා දැමිණි. රෝග ලක්ෂණයට පහර දීමෙන් රෝගය සුව නොවනවා පමණක් නොව රෝග නිධානය හඳුනාගැනීම දෙසට යොමුවීම වැළකී යයි. හොරාට නොව වෙන අනෙකෙකුට "අන්න හොරා" යයි අත දිගු කිරීමක් වෙයි.

## ලෝකාවේශය හා යුවරජවරු


එකම වේදිකාවක සිට එක්වර රෝග ලක්ෂණයත්, ප්‍රතිකාරයත් දේශනා කරද්දී තමන් අත් විඳින සියලු දුක් කම්කටොළු වල හා බේදවාචකයන්හි ඒකායන හේතුව, ප්‍රභූන් යැයි හඳුන්වනු ලැබූ අධිපතීන්ගේ වංචා-දූෂණ යැයි ජනතාවට ඒත්තු ගියාට සැකයක් නැත. එබැවින් විපත් කටින පවිකාරයින්ට ගල් ගසා එළවා දැමීම ඉලක්ක කරගත් බලවේගය තුළ මහජනයා ඒකරාශී වූහ. නිශේධනය (වංචා-දූෂණ අල්ලා ගැනීම හා ඊට ඉඩ නොතැබීම) පිළිබඳව ගොඩනගා ගත් තරමේ එකඟත්වයක් හා ගාමක බලයක් සාධනීය හෙවත් කළයුතු දේ පිළිබඳව ගොඩනගා ගෙන ඇති බවක් පෙනෙන්නට නැත. වෙනත් වචන වලින් කිවහොත් නොකළ යුතු අකුසල් පිළිබඳව මිස කළයුතු කුසල් පිළිබඳව එකඟත්වයක් ගොඩනගා ගෙන නැත. සමාජයේ පවත්නේ බරපතල විෂමතාවක් නිසාත් එක් එක් සමාජ පන්තියේ අභිලාෂයන් එකිනෙකට වෙනස් නිසාත් කළයුතු දේ (කුසල්) විශාල පරාසයක විසිර පවතී. එබැවින් පොදු එකඟත්වයකට පැමිණීම අසීරුය. එපමණක් නොව අයි.එම්.එෆ්. වැඩ සටහනට යටහත්-පහත් ලෙස කීකරු වී තිබෙන නිසා වෙන අනෙක් සංවාදයක් ඇතිවීමේ ඉඩකඩ ඇහිරී ඇත. ලෝකාවේශයක් බවට පත්ව තිබෙන අන්තර්ජාතික හා කලාපීය ආධිපත්‍ය රජයන වර්තමානයේ අපගේ වැනි රටවල ස්වාධීනත්වය හා ස්වෛරීත්වය බාල්දු වී රාජ්‍ය නායකයෝ යුවරාජයින් බවට පත්ව සිටිති. යුවරාජයෙකුට මහරජු අභිබවා යා නොහැක. නව යටත්විජිතවාදය කළඑළි බැස සක්‍රීයව පවතින්නේ එපරිද්දෙනි. රෝග නිධානය නම් මේ නව යටත්විජිතවාදයයි.

දේශපාලන බලය ප්‍රභූ පන්තියෙන් ගලවාගෙන නිර්ප්‍රභූන් අතට පත් කිරීම යුග-නිර්මාණාත්මක ප්‍රගතිශීලී පරිවර්තනයක් ලෙස උත්කර්ෂයට නංවනු ලැබිණි. නිර්ප්‍රභූවරයෙකු වීමේ හේතුවෙන්ම කෙනෙකු අදූෂිත හා පාරිශුද්ධභාවයට පත්වන්නේ නැත. එය කිසිසේත්ම නොසිදුවන්නකි. තර්කානුකූල නොවන නිගමනයකි. මෙහි දී ප්‍රභූ-නිර්ප්‍රභූ බෙදීමක් හා සංවාදයක් පටන් ගැනීමෙන් සිදුවී තිබෙන්නේ සැබෑ බෙදීම වෙනුවට වෙනත් මාතෘකාවක් කරලියට ගෙන ඒමය. සැබෑ විසඳුම යටපත් කර දැමීමය.

රට මුදාගත යුතුව තිබෙන්නේ ප්‍රභූන්ගෙන් නොව ව්‍යාජ ප්‍රභූන්ගෙන්ය. සැබෑ ප්‍රභූවරයා සහ ව්‍යාජ ප්‍රභූවරයා හඳුනා ගන්නේ කෙසේද? ගැඹුරින් විග්‍රහ කර බලන විට මේ බෙදීම සමාජමය වටිනාකම් දක්වාත්, එපමණක් නොව අපගේ සහ අපගේ වැනි වෙනත් රටවල සමාජ-ආර්ථික බෙදවාචකයන්හි මූලෝත්පාදක අධිතාලම වූ නව යටත්විජිතවාදය දක්වාත් දිවෙන බව පෙනී යනවා ඇත.

## හඳුනා ගැනීමේ පෙරෙට්ටුව

'පොහොසත්-මධ්‍යම-දුප්පත්' යන ආදායම හා ධනය මත පදනම් වූ පංති පෙළගැස්ම ජනසමාජයේ සිරස් බෙදීමක් ලෙස ගතහොත් 'ප්‍රභූ-සාමාන්‍ය-අසංවර' යන බෙදීම තිරස් බෙදීමක් වේ. පොහොසත්-මධ්‍යම-දුප්පත් යන සැම සමාජ පංතියකම ස්වල්ප දෙනෙක් වූ ප්‍රභූන්ද බහුතරයක් වූ සාමාන්‍ය ජනයාද තවත් ස්වල්ප දෙනෙක් වූ සමාජ අසංවරයින්ද වෙති. එමෙන්ම ප්‍රභූත්වයට නොසරිලන පුද්ගලයින් ප්‍රභූ වෙස්ගෙන සිටිනවාද, අසංවරයින් සේ පිටු නොදැකිය යුතු අය එලෙස කොන් කර තිබෙනවාද දකින්නට පුළුවන.




සැම සමාජ-ආර්ථික පන්තියකම අසංවර පිරිස් සිටිති. උදාහරණයක් ලෙස අල්ලස හා දූෂණයෙන් ද නීති විරෝධී මාර්ගයෙන්ද ව්‍යාපාරික කටයුතු කරන්නෝ අසංවර පිරිසට අයත් වෙති. විකෘති කරනු ලබන වෙළඳපොල උච්චාවචනයන් ආත්ම ලාභය පිණිස හරවාගන්නෝද අසංවර පිරිසට අයත් වෙති. ඔවුන් රැස්කර ගන්නා අතිරේක මුදලට වෙළඳපොල භාෂාවෙන් "ලාභය" යැයි කියනු ලැබේ. හොරකමක් යැයි කියනු නොලැබේ. සැම පංතියකම සමාජ විරෝධී-නීති විරෝධී ක්‍රියාවන්හි නිරත වන්නෝද අපරාධකරුවෝද සිටිති. ඔවුන් සියලු දෙනා අසංවර කාණ්ඩයට අයත් වේ.

ඊළඟට අප බැලිය යුත්තේ ප්‍රභූවරයෙකු හඳුනා ගන්නා නිර්ණායක මොනවාද කියාය. ප්‍රභූවරයෙකු යනු දැන උගත්කමින්, වත්පොහොසත් කමින්, නිහතමානී සරල පරිභෝජනයෙන්, සමාජ සත්කාරක ක්‍රියාකාරකම්හි යෙදීමෙන්, මානව දයාවෙන් හා භක්තියෙන්, තත්කාලීන සමාජයේ තමන් අයත් සමාජ පංතියේ සාමාන්‍ය මට්ටමට වඩා ඉහළින් සිටින්නෙකි. සමාජයේ පොදු යහපත අරභයා ක්‍රියා කරන්නෙකි. සමාජයට නායකත්වය දෙන්නෙකි. ඊයේ සිදුවුන දේත්, අද සිදුවන දේත්, හෙට සිදුවිය හැකි දේත් අවබෝධ කර

ගැනීමේ සමතෙකි. සැබෑ ප්‍රභූවරයෙකු වීමට ජාතිය, ආගම, පරම්පරාව, පෙළපත්නාමය හෝ කුලය බලපාන්නේ නැත. කථාකරන භාෂාව බලපාන්නේ නැත. බුදුන් වහන්සේ බ්‍රාහ්මණ-වසල වෙන්කිරීම ගැන කරුණු දක්වමින් කෙනෙකු ජන්මයෙන් බ්‍රාහ්මණයෙකු හෝ වසලයෙකු නොවන බවත් ක්‍රියාවෙන්ම බ්‍රාහ්මණයෙකු හෝ වසලයෙකු වන බවත් දේශනා කළහ. වසල සූත්‍රයෙහි සඳහන් ''න ජච්චා වසලෝ හොති, න ජච්චා හොති බ්‍රාහ්මණෝ'' යනාදී පාඨ සුදුසුලෙස පද ගලපා ගත් කළ (mutatis mutandis) ප්‍රභූවරයා සම්බන්ධයෙන්ද අදාල කරගත හැකිය.

ප්‍රභූවරයෙකු වීමට තිබිය යුතු සුදුසුකම් මෙන්ම නොතිබිය යුතු නුසුදුසුකම් හෙවත් නිශේධනාත්මක ගති ලක්ෂණද ගණනාවකි.

### උඩ මළුවට හොර වීසා

නිල උගත්කම පෙන්වන විභාග සහතික, නම්බුනාම හා වෙනත් ආටෝප - සාටෝප වලින් සැරසී සිටින්නේ වුවද, සැබෑ දැන උගත්කමක් නැත්තෝද ආරූඪ කරගත් පණ්ඩිතමානයෙන් පෙළෙන්නෝද, ප්‍රභූත්වයට නොගැළපෙති. ප්‍රභූත්වයට තුඩුදෙන දැන උගත්කම සමග සුශික්ෂණය හා සුභාෂිතය එක්ව පවතී. ධර්මයට අනුව එය මංගල කාරණයක්ද වේ. විභාග සමත්වීමෙන් පමණක්ම දැන උගත්කම නොලැබේ. ප්‍රභූත්වයට හිමිකම් නොලැබේ.

සම්පත් පැහැර ගැනීමෙන්, සේවක හිමිකම් නොතකා හැරීමෙන් හා ඔවුන් නූතන වහල් සේවයෙහි යෙදවීමෙන් (modern slavery) හා අය බදු වැනි සමාජ වගකීම් පැහැර හැරීමෙන් ආධාර්මිකව රැස්කර ගන්නා වත්පොහොසත්කම, හරිහම්බ කරගත් වත්පොහොසත් කමක් ලෙසට ගිණිය නොහැකි අතර එවැනි පොහොසත් කමක් ප්‍රභූ වයට හේතු කාරක වන්නේ නැත. ආර්ථික-සමාජයීය හා සංස්කෘතික විෂමාචාරයෙන්, අවකල්ක්‍රියාවෙන්, නොපනත්කමින් හා මත්ද්‍රව්‍ය වෙළදාම හා සූදුපොළවල් පවත්වාගෙන යාම වැනි නොකළ යුතු වෙළදාමෙන් රැස්කර ගන්නා ධනයෙන් විරාජමාන වන්නෝද, ප්‍රභූත්වයට සුදුසු වන්නේ නැත. ආධිපත්‍ය පවත්වා ගැනීමත්, ප්‍රති ාහකයින් නතු කරගැනීමත්, දූගී බව දිගින් දිගට පවත්වාගෙන යාමත් තහවුරු කෙරෙන, ඉහළින් පහළට දිගු කරන, මායාකාරී සමාජ සත්කාරක ක්‍රියා, සමාජසේවා හෝ දිළිඳු සහන සේවා පවත්වාගෙන යාමද ප්‍රභූ වයට හේතු කාරක වන්නේ නැත.

රටට හා ලෝකයට ණය වී සැප විඳින්නෝද, අධිපරිභෝජනයෙන් හා ප්‍රදර්ශනාත්මක පරිභෝජනයෙන් සැනහෙන්නෝද ප්‍රභූ වයට සුදුසු වන්නේ නැත. අධිපරිභෝජනයට හා ප්‍රදර්ශනාත්මක පරිභෝජනයට ඇබ්බැහිවූ තැනැත්තන් දිගින් දිගටම ණය වීමට ද, අනුන් තලා පෙලා ධනවත් වීමටද සේවක කාරකදීන් නොසලකා ඔවුන් අඩු වැටුපෙහි ගිල්ලවා තැබීමටද පෙළඹෙති. එහෙයින් ප්‍රභූවරයෙකු වීමට උවමනා මූලික සුදුසුකම් ඔවුන්ට සම්පූර්ණ කරගත නොහැකි ය

සුදුසුකම් නොමැතිව සහ නුසුදුසුකම් වසන් කරගෙන ප්‍රභූ වෙස් ගෙන සිටින්නෝ සැබෑ ප්‍රභූන් නොවේ, ඔවුන් හොර වීසා මගින් රටකට ඇතුල් වන්නාවූ පුද්ගලයන් බඳුය, වෙස්වලාගත් ප්‍රභූන් හෙවත් ව්‍යාජ ප්‍රභූන් (pseudo elite) ය. රටට අවැඩ කරන්නෝය. දේශපාලන බලය අභිමි කළ යුත්තේ ඔවුන්ට ය. ප්‍රභූ බලකොටුව බිඳහෙලා දේශපාලන බලය නිර්ප්‍රභූන් අතට ගත යුතුයැයි හඬගෑම නිවැරදි නොවේ. නිර්ප්‍රභූන් යන්න සාවද්‍ය ව්‍යවහාරයකි. එනමින් හැඳින්විය හැකි පිරිසක් නැත. ඇත්තේ සැබෑ ප්‍රභූ සහ ව්‍යාජ ප්‍රභූන්ය. පාලන බලය පැවතිය යුත්තේ සැබෑ ප්‍රභූ අතය.

## ප්‍රභූන් සේ නැගී සිටිමු

මෙහි සඳහන් කරන ලද ධනාත්මක පරාමිතීන්ට අනුකූල වන්නාවූද, නිශේධනාත්මක ගති ලක්ෂණ නොමැත්තාවූ ද සියළු සද්ජනයා ප්‍රභූවරුය. 1948 න් පසු නොව ඊටත් පෙර සිට හැඩ ගැසීගෙන ආ ශ්‍රී ලාංකික ජාතිකත්වය හා බැඳුන වටිනාකම් හා හර පද්ධතිය තුල සැබෑ ප්‍රභූන් පිරිසක් ගොඩනැගී සිටියාහ. ගුරුවරයාද, වෛද්‍යවරයා ද මේ ප්‍රභූ පිරිස අතර වූහ. ලිබරල් ධනවාදී ආර්ථික චින්තාවත්, වාණිජකරණයත්, ලෝකාවේශයත් (ගෝලීයකරණයත්) යන මහා රළ පහරට හසුවී සමාජ වටිනාකම් හා හර පද්ධතීන් උඩු-යටිකුරු වීමෙන් පසු, එම ප්‍රභූවරුන්ගෙන් බොහෝ දෙනෙක් ප්‍රභූත්වය අහෝසි කර ගත්හ. ගුරුවරුන්ගේ බහුතරය උපකාරක පංති සාගරයේ ගිලී යාමෙන්ද, වෛද්‍යවරුන් වැඩි පිරිසක් උග්‍ර ලෙසම මුදලට ගිජු වීමෙන්ද, ප්‍රභූත්වය අහිමි කර ගත්හ. මේ පිරිහීම දේශපාලන, පරිපාලන, වෘත්තීය සේවා, පැවිදි, අධිකරණ යන හැම ක්ෂේත්‍රයකම සිදු වී ඇත. පාර්ලිමේන්තුවද අමාත්‍යවරු හා ජනාධිපතිවරුද ආසාදනයට ලක් කර ඇත.

ප්‍රභූවරයෙකු වීමේ පිවිසුම් මාර්ගය ගැන ඇති නොදැනුවත්කම, සීමිත අවකාශය හා ඒ මාවතට පිවිසීමට ඇති බිය හා පසුබට වීම, නව යටත්විජිතවාදී මානසිකත්වය ලෙස සංක්ෂිප්තව හැඳින්විය හැකි ඉංග්‍රීසි භාෂාව ආභරණයක් ලෙස යොදා ගැනීම හා බටහිර සිරිත් විරිත් හා ඇවතුම් - පැවතුම් ප්‍රභූ සමාජයේ සළු පිළි යැයි වරදවා ගැනීම, සැබවින්ම ශ්‍රී ලාංකික නව ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක් බිහි වීමට බාධක වී තිබේ. නව යටත්විජිත රැහැණින් බැඳී සිටින තාක් කල් අපට ශ්‍රී ලාංකීය ජාතියක් වශයෙන් හිස එසවීමට නොහැකිය. ශ්‍රී ලංකාව සුව පහසු රටක් බවට හැරවීමටත් ශ්‍රී ලාංකික ජනතාව ප්‍රීතිමත් ජනතාවක් බවට පත් කිරීමටත් රෝග නිධානය වූ නව යටත්විජිත ක්‍රමය බිඳ හෙළිය යුතුය. ඒ සඳහා නායකත්වය ගැනීමට අපට බුද්ධිමත් බොහෝ ප්‍රභූවරුන් උවමනාය. තමන් පුංචි යැයි හෝ පහත් යැයි යන හීන මානයකින් තොරවූ විට සෑම පුරවැසියෙකුටම ප්‍රභූවරයෙකු විය හැකිය. දෙවුන්දරතුඩුවේ සිට පේදුරුතුඩුව දක්වාම මේ රටේ සිටින්නේ අභිමානවත් ජනතාවක් නොවන්නේද? අමෙරිකා එක්සත් ජනපදයේ රූස්වෙල්ට් ජනාධිපති ආර්යාව පවසා ඇතිවාක් මෙන් "ඔබගේ කැමැත්ත නොමැතිව ඔබව පහත් කර දැමීමට කිසිවෙකුට නුපුළුවන" (No one can make you feel inferior without your consent - Eleanor Roosevelt). ඇයි යටත්ව සිටීමට හා දෙවැනි වීමට කැමැති වන්නේ? ඔබට ප්‍රභූවරයෙකු විය හැකිය. ඔබද ප්‍රභූවරයෙකු විය යුතුය.